# බටහිරට හිස නොනමන ලෝකයක්

සරත් ෆොන්සේකා යනු කවුදැයි තවමත් තේරුම් ගැනීමට නොහැකි ජාතිකවාදීන් වෙතොත් ඔවුන්ට බටහිරයන්ගේ ම සරණ ය. හිටපු ජෙනරාල් තම රාජද්‍රෝහි පිළිවෙත කිසිම සැකයකට ඉඩ නොතබා ප්‍රදර්ශනය කර ඇත. තම ජීවිතය වෙනුවෙන් ඕනෑම පාවාදීමක් කිරීමට අද ඔහු සූදානම් ය. ජ වි පෙරමුණට සරත් සරණ හැරෙන්නට වෙනත් සරණක් නොමැති බැවින් ඒ පක්ෂයෙහි නායකයෝ ඔහු වෙනුවෙන් පෙනී සිටිති. සරත් ෆොන්සේකා නොවන්නට ජ වි පෙරමුණට එකදු මන්ත්‍රීවරයකුවත් නොලැබෙන බව ඒ පක්ෂයෙහි නායකයෝ හොඳාකාරව ම දනිති. ජ වි පෙ සරත් සරණං ගච්ඡාමි යැයි පවසන විට සරත් ෆොන්සේකා බීබීසි සරණං ගච්ඡාමි යැයි කියයි. මෙරට ඉතිහාසයේ භයානක ම හා තකතීරු ම වූ ඕපාදූපය වන සුදු කොඩිය  දැන් බීබීසියේ හුළං හමන අතට වැනෙයි. මෙරට ඇතැම් උගතුන්ට බීබීසිය තවමත් අපක්ෂපාති ජනමාධ්‍යයකි. එසේ සිතීමට අපට පුරුදු කෙළේ ද බීබීසිය ය. එහෙත් මොලොව පුහුදුන් කිසිවකු හෝ එවැන්නන් මගින් ක්‍රියාත්මක වන ආයතනයක් හෝ අපක්ෂපාති නොවන බව අපි බොහෝ කලෙක සිට කියමු. බීබීසිය තරම් ඉංගිරිසි සංස්කෘතියට පක්ෂපාති ජනමාධ්‍යයක් තවත් නැත. බීබීසිය ඔසවාගෙන යන්නේ බටහිර නූතනත්වයේ ධජය ය. බීබීසියට සිංහ ධජය නයාට අඳුකොළ මෙනි.

සරත් ෆොන්සේකාගේ සුදු කොඩි කතාව අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ දී කරන ලද ප්‍රකාශයකින් ඇරඹිණි. එහි දී ඔහු කටමැත දොඩවමින් සුදුකොඩි රැගෙන ආවුනට වුවත් වෙඩි තැබීමට තමන් ඇතුලු හමුදාව පියවර ගෙන තිබිණි යැයි කීවේ ය. එය පුහු පුරසාරමක් වුවත් එයින් හමුදාවේ කීර්ති නාමයට විශාල කැළලක් එක් විය. බටහිරයෝ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත්හ. ෆොන්සේකා ලවා ආරක්ෂක ලේකම්තුමාටත් මේජර් ජෙනරාල් ශවින්ද්‍ර සිල්වා මහතා ඇතුලු රණවිරුවන්ටත් පොදුවේ ආණ්ඩුවටත් විරුද්ධව සාක්ෂි ලබා ගැනීමට ඔවුහු ඉතා සූක්ෂම ව කටයුතු කළහ. ඒ සඳහා ෆොන්සේකාට විරුද්ධව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකිරීමට බටහිරයන් තීරණය කර ඇති බව පැහැදිලි ය. එපමණක් නොව ඔහුට ආර්ථික වශයෙන් සැලකීමට ද තීරණය කර ඇතැයි අපට සිතෙන්නේ නොඉඳුල් ඩොලර් අනුගාමී අනුඅංක සහිත ව රූපවාහිනියේ දැකගැනීමෙන් පසුව ය.

බීබීසියේ හාඩ් ටෝක් වැඩසටහන වෙනුවෙන් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ප්‍රශ්න ඇසූ ස්ටීවන් සැකර්ට දැනගැනීමට අවශ්‍ය වූ එක් කරුණක් වූයේ ජෙනරාල්ව අත්අඩංගුවට ගෙන ඇත්තේ සුදුකොඩි කතාව හෙළිදරවු කිරීම නිසා ද යන්න ය. එහෙත් අපට තිබෙන ප්‍රශ්නය සුදුකොඩි කතාව සම්බන්ධයෙන් ජෙනරාල් ව යුද්ධාධිකරණයට යොමු නොකෙළේ ඇයි ද යන්න ය. ඒ සම්බන්ධයෙන් ඔහුට විරුද්ධ ව චෝදනා ඉදිරිපත් වී ඇත්තේ සිවිල් අධිකරණයෙහි ය. හමුදාවට හා ආරක්ෂක අමාත්‍යාංශයට ඒ සම්බන්ධයෙන් විශේෂ හේතු තිබෙනු හැකි ය. ඇතැම් විට ඒ කරුණු නඩු විභාගයේ දී හෙළිදරවු වනු ඇත. ඒ කෙසේ වෙතත් සුදුකොඩි කතාව යනු හෙළිදරවුවක් නො වේ. ඒ අතේ පැළවෙන බොරුවකි. ෆොන්සේකා අම්බලන්ගොඩ කතාවේ සිට සන්ඩේ ලීඩර් හරහා මැත දී බීබීසියට හොරෙන් කළ ප්‍රකාශය දක්වා කියා ඇති දේ එකිනෙකට පරස්පර ය. ඔහුට සංගත ව බොරුවක් කීමට නොහැකි බව ඒ සියල්ලෙන් පැහැදිලි වෙයි. ආරක්ෂක ලේකම්තුමා මේජර් ජෙනරාල් ශවින්ද්‍ර සිල්වා මහතාට සුදුකොඩි රැගෙන එන අයකුට වුවත් වෙඩි තැබීමට කියා ඇති බව ඇසී ඇත්තේ කවුදෝ ජනමාධ්‍යවේදියකුට ය. ඒ ජනමාධ්‍යවේදියා කවුදැයි අපි තවමත් නො දනිමු. ඔහු බීබීසී නම් පව සංස්ථාවේ ජඩමාධ්‍යවේදියෙක් ද? එසේත් නැත්නම් බටහිර රටක දේශපාලන රැකවරණ බලාපොරොත්තුවෙන් සිටින ලංකාවේ ජඩමාධ්‍යවේදියෙක් ද? සරත් ෆොන්සේකා තවමත් ඒ කවුදැයි හෙළිදරවු කර නැත. බීබීසියේ සැකර්ට ද ඒ දැනගැනීමට අවශ්‍ය වී නැත.

සැකර් සමග ෆොන්සේකා රහස් දූරකථන සාකච්ඡාවක් කර ඇත්තේ නාවික කඳවුරේ සිට ය. සාමාන්‍යයෙන් රිමාන්ඩ් සිරභාරයේ සිටින සිරකරුවන්ට එවැනි වරප්‍රසාද නැත. මන්ත්‍රීවරුන් රිමාන්ඩ් සිරභාරයට ගත්විට වුවත් එවැනි වරප්‍රසාදයක් හිමිවේ ද? ෆොන්සේකාට පිටරට චාරිකාවකට ද ඉඩ දී ඇතැයි පැවසෙයි. රාජද්‍රෝහි දේශද්‍රෝහි ප්‍රකාශකරන, මන්ත්‍රිවරයකු වුවත් සාපරාධී චෝදනා මත අත්අඩංගුවේ පසුවන්නකුට මෙවැනි පහසුකම් සලසාදිය යුතු ද? ෆොන්සේකා ඒ සියල්ල යොදාගන්නේ රටට රාජ්‍යයට හා රණවිරුවන්ට විරුද්ධව ය. මෙරට සිදු වී යැයි කියන යුද්ධාපරාධ සම්බන්ධ පරීක්ෂාකිරීමට ජාත්‍යන්තර කොමිසම්වලට ඉඩදිය යුතු නො වේ. බටහිරයන් ඒ සඳහා දැනට ඉදිරිපත් කරන්නේ ෆොන්සේකාගේ සාක්ෂිය හා අප රටට ද්‍රෝහි වූ රාජ්‍ය නොවන ආයතන ගණනාවක ප්‍රකාශ ය.

© Prof. Nalin De Silva

අපේ රටේ ස්වෛරීභාවයට ඇඟිලි ගැසීමට කිසිවකුට ඉඩදිය යුතු නො වේ. වර්තමාන ලෝක තත්වයන් යටතේ රටවල ස්වෛරීභාවය අඩු වී ඇතැයි කියන පඬියන්ට අප කියන්නේ කිනම් අර්ථයකින් ගත්තත් රටවල ස්වෛරීභාවය සමමිතික විය යුතු බව ය. ලංකාවට නොමැති ස්වෛරීභාවයක් ඇමරිකාවට තිබිය නො හැකි ය. ඇමරිකාවේ යුද්ධාපරාධ විනිශ්චය කරන්නේ කිනම් ජාත්‍යන්තර කමිටුවක් ද? ෆොන්සේකා මේ අතර කියන්නේ ඔහුගේ අණ යටතේ පැවති හමුදාවෙන් යුද්ධාපරාධ සිදු නොවූ බව ය. පසුගිය වසරේ මැයි මස ද හමුදාපති ඔහු ම විය. එසේ නම් ඔහු කියන අන්දමට ඒ මාසයේ යුද්ධාපරාධ සිදු වී නැත. සුදුකොඩි කතාව ඒ මාසයේ සිදුවුවක් යැයි කියැවෙයි. ඒ මාසයේ සිදුවන්නට ඇතැයි කියන යුද්ධාපරාධ සිදු වී ඇත්තේ වෙනත් අයකු හමුදාපති ධුරය දැරූ හමුදාවකින් ද?

එහෙත් බීබීසියට මේ කිසිවක් සෙවීමට අවශ්‍ය නැත. බීබීසියේ ඊනියා ගවේෂණාත්මක ජනමාධ්‍යවේදය එබඳු ය. මෙරට බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනයෙන් සිහි විකල් වූ ඊනියා උගතුන්ට නම් බීබීසිය ජනමාධ්‍යවේදයේ පරමාදර්ශය ය. ඒ අපක්ෂපාත ය. ඒ ගවේෂණාත්මක ය. පුවතක් තහවුරු කරගැනීමෙන් තොරව ප්‍රචාරය නො කරයි. සියල්ලන්ට ම සාධාරණය ඉටුකරයි. එහෙත් බීබීසිය ඇත්තේ වෙනත් කිසිවකට නොව බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලොව පුරා ප්‍රචලිත කිරීමටත් බටහිර සංස්කෘතික ආධිපත්‍යය ප්‍රමුඛ කරගනිමින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය තහවුරු කිරීමටත් අවසානයේ දී බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය තවදුරටත් පවත්වාගෙන යැමටත් ය.

පසුගිය දා ඊශ්‍රායලය සම්බන්ධයෙන් ඇමරිකාව ගත් පියවරෙන් මේ බව තවත් තහවුරු වෙයි. ගාසා තීරයෙහි හමාස් ආණ්ඩුවක් ඡන්දයෙන් පත්වීම ගැන ඊශ්‍රායලය විරුද්ධ ය. ඊශ්‍රායලය ගාසා තීරයට, එනම් එහි ජනතාවට එරෙහිව බාධකයක් පැණවී ය. එයට එරෙහිව ගාසා තීරයට ආධාර රැගෙන ආ නැව් කිහිපයකට ඊශ්‍රායලය පහර එල්ල කෙළෙ ය. එහි දී තුර්කි ජාතියන් කිහිප දෙනෙක් මිය ගියහ. මේ ඝාතන පසුගිය මැයි 31 වැනි දා ජාත්‍යන්තර මුහුදෙහි දී සිදු විය. මේ සම්බන්ධයෙන් පරීක්ෂාකිරීමට ජාත්‍යන්තර කොමිසමක් ඉල්ලූ නමුත් ඊශ්‍රායලය යළිට විරුද්ධ විය. දැන් ඊශ්‍රායලය ඒ සම්බන්ධයෙන් ව්‍යාජ කොමිසමක් පත්කර ඇත. එහි ඊශ්‍රායල් ජාතික තිදෙනක් ද බටහිර රටවලින් තෝරාගත් දෙදෙනෙක් ද වෙති. එහෙත් මේ දෙදෙනාට අවසාන තීරණය ගැනීමේ දී ඡන්ද බලයක් නැත. අනෙක් අතට කොමිසමෙන් විභාග කිරීමට යන්නේ ජාත්‍යන්තර නීතියට අදාළ කරුණු මිස ඊශ්‍රායල් ආණ්ඩුව ඝාතන තීන්දුව ගැනීමේ දී දේශපාලනික ව ගත් ක්‍රියා මාර්ග නො වේ.

අමෙරිකාව මේ සියල්ල සම්බන්ධයෙන් කියන්නේ මෙය ඊශ්‍රායලයේ අභ්‍යන්තර ප්‍රශ්නයක් බවත් ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීම ඊශ්‍රායලයට අයිතියක් හා හැකියාවක් ඇති බවත් ය. එහෙත් ෆොන්සේකාගේ සුදුකොඩි හා වෙනත් එවැනි ඕපාදූප මත පදනම් ව ජනාධිපතිතුමා හා ආරක්ෂක ලේකම්තුමා ජාත්‍යන්තර යුද්ධධිකරණයට ගෙන යැමට බටහිරයෝ සූදානම් වෙති. ඒ සඳහා බීබීසිය චැනල් ෆෝ වැනි ජනමාධ්‍ය පාර කපති. ඔවුනොවුන් අතර සුලු සුලු වෙනස්කම් තිබුණ ද බටහිර දේශපාලනඥයෝ ද ජනමාධ්‍යවේදීහු ද ඊනියා බුද්ධිමත්තු ද එකට ක්‍රියා කරති.

ඒ බටහිර යුදෙව් ක්‍රිස්තියානි යටත්විජිතවාදය වෙනුවෙනි. බටහිර යුදෙව් ක්‍රිස්තියානි යටත්විජීවාදය යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය මත පදනම් වෙයි. බටහිරයෝ ඒ සංස්කෘතිය ආර්ථිකය හා දේශපාලනය ප්‍රචලිත කිරීමට තහවුරු කිරීමට කටයුතු කරති. එහි දී එම සංස්කෘතියට අයත් රටවලට අනෙක් රටවල් පෑගීමට ආධාර කරති. බටහිරයන් ඊශ්‍රායලයට ආධාර කරන්නේ එබැවින් මිස අමෙරිකාවේ ශක්තිමත් යුදෙව් ජනාවාස ඇති නිසා ම නො වේ. අනෙක් අතට බටහිරයෝ අප වැනි රටවලට එරෙහි වෙති. ඒ ඔවුන්ගේ යුදෙව් ක්‍රිස්තියානි යටත්විජිතවාදය වෙනුවෙනි. මෙහි දෙබිඩි පිළිවෙතක් නැත. අප රටෙහි ද එක්කෝ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියක් තිබුණි නම් හෝ අඩුම තරමින් බටහිරයන්ට නමත ආණ්ඩුවක් පැවතියේ නම් බටහිරයන් සරත් ෆොන්සේකා මිරිකූ දෙහි ලෙල්ලක් මෙන් විසිකරනු ඇත. එහෙත් අද ඔහු ඔවුනට වැදගත් වෙයි. බටිරයන් අවුරුදු පන්සියයක් මුළුල්ලෙහි ක්‍රියා කරන්නේ මුළු ලෝකය ම තම සංස්කෘතියට ආර්ථිකයට හා දේශපාලනයට හසුකර ගැනීමට ය.

අප මෙයට විරුද්ධව බටහිර නොවන ලෝකයේ රටවල් අතර ශක්තිමත් බැම්මක් ගොඩනගා ගත යුතු ය. මහින්ද රාජපක්ෂ මහතා එවැන්නක් කිරීමට උත්සාහ ගන්නා බවක් පෙනී යයි. ඒ මහතාට ඒ සඳහා ශක්තිය ලැබේවා යැයි අපි ප්‍රාර්ථනය කරමු. ඊශයාලය විසින් අටවා ගනු ලැබ ඇති කොමිසම නඩුත් හාමුදුරුවන්ගෙ බඩුත් හාමුදුරුවන්ගේ වර්ගයේ එකකි. එයින් ලැබෙන නිගමනය ගැන ඔට්ටු ඇල්ලීමට අවශ්‍ය නැත. ඒ එතරම් ම පැහැදිලි ය.

© Prof. Nalin De Silva

අප බටහිරයන්ගේ නීති පද්ධතිය ද ඇතුළත් දැනුම ගැන විශ්වාසය තබන තෙක් මේ ආධිපත්‍යයෙන් පූර්ණ ගැලවීමක් නැත. අප අපේ දැනුම නිර්මාණය කරන අතර බටහිර යුදෙව් ක්‍රිස්තියානි නොවන රටවල් සංවිධානය කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva